විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 04/2022

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2022.06.08

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් පාලන ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක : 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2017.10.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017 හා 2017.10.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2017කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

02. ඒ අනුව, වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ නැවත ලියාපදිංචි කිරීම සඳහා දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කළ පසුව, එම තොරතුරු පුද්ගලික ලිපිගොනුවට අනුව සහතික කර පද්ධතිය තුළ අනුමත කිරීම පුද්ගලික ලිපිගොනුව භාර නිලධාරියා විසින්ම සිදු කළ යුතු වේ.

03. එලෙස අනුමත කිරීමෙන් පසු පරිගණක පද්ධතියෙන් ලබා ගන්නා නව වැන්දඹු අනත්දරු සාමාජික පත්‍රයේ පිටපතක් නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. තවද මුද්‍රිත අයදුම්පත්‍ර හා අදාළ ඇමුණුම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වමි.

04. විෂය භාර නිලධාරීන් ස්ථාන මාරු වී යන අවස්ථාවල පරිශීලක ගිණුම් (User Account) අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. නව සේවා ස්ථානයේදී ද ඉහත විෂයයම භාරව කටයුතු කරන්නේ නම් නව සේවා ස්ථානය ඇතුළත් කර පෙර පරිශීලක ගිණුම නැවත සක්‍රිය කර ගත හැකිය.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
2. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk